දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

දෙවන වාර පරීක්ෂණය - 2019

12 ශ්‍රේණිය | **කෘෂි විද්‍යාව** | **විසඳුම් පත්‍රය**

I - පත්‍රය

01. - 3	02. - 5	03. - 2	04. - 3	05. - 2	06. - 4	07. - 2	08. - 3	09. - 2	10. - 3
11. - 3	12. - 1	13. - 2	14. - 2	15. - 3	16. - 3	17. - 2	18. - 4	19. - 5	20. - 3
21. - 3	22. - 2	23. - 1	24. - 2	25. - 4	26. - 5	27. - 1	28. - 4	29. - 2	30. - 4
31. - 3	32. - 4	33. - 4	34. - 5	35. - 3	36. - 2	37. - 5	38. - 4	39. - 2	40. - 4
41. - 2	42. - 4	43. - 2	44. - 2	45. - 5	46. - 2	47. - 4	48. - 2	49. - 3	50. - 3

II - පත්‍රය - A කොටස

(01) A) i. a) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
b) ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
c) ජාතික පොහොර ලේකම් කාර්යාලය (4 × 3)

ii. 1. ආහාර හා කෘෂිකර්ම සංවිධානය
2. ජාත්‍යන්තර සහල් පර්යේෂන මධ්‍යස්ථානය
3. ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය (4 × 2)

B) i. තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානය

ii. a - වියළි බල්බ උෂ්ණත්වමානය
b - තෙත් බල්බ උෂ්ණත්වමානය
c - කැනවස් රෙදි කැබැල්ල
d - ජලය සහිත බඳුන (4 × 4)

iii. සාපේක්ෂ ආර්ද්‍රතාවය (4 × 1)

iv. පැය 8.30 හා පැය 15.30 (4 × 2)

v. රෝග හා පළිබෝධ ව්‍යාප්තිය වැඩි වේ.
සුළඟින් පරාගනය වන බෝගවල පරාග ව්‍යාප්තියට බාධාවකි.
උත්ස්වේදනය අඩු වීම නිසා ජල අවශෝෂණය අඩු වේ.
බීජ ගබඩා කිරීම අපහසු වේ. (4 × 2)

vi. ආරක්ෂිත ව්‍යුහ තුළ බෝග වගා කිරීම (4 × 1)

C) i. ක්ෂේත්‍ර ආතතිමානය (4 × 1)

ii. A - මීටරය
B - ආමානය හා කොපුව සම්බන්ධ පාරදෘශ්‍ය නලය
C - සවිවර කොපුව (4 × 3)

iii. පසේ තෙතමන ප්‍රතිශතය නිර්ණය (4 × 1)

iv. සවිවර වීම (4 × 1)

v. pF = 0 - 2.9 අතර (4 × 1)

vi. වාසි : ලවණ සාන්ද්‍රණයට සංවේදී නොවන නිසා ලවණ සහිත පස් සඳහා සුදුසු වේ.
අවාසි : වියළි කාලයේ භාවිතයේ දී නිතර නිතර ජලයෙන් පිරවිය යුතු වීම (4 × 2)

vii. ජිප්සම් කුට්ටි (4 × 1)

02. A) i. A රාමුව (4 × 1)

ii. සමෝච්ඡ රේඛා ලකුණු කිරීම (4 × 1)

iii. a) සෝල්ට් ක්‍රමය / දෙවැටි ක්‍රමය (4 × 1)
b) ග්ලිරිසීඩියා (4 × 2)

iv. 1. රනිල ශාක මඟින් නයිට්‍රජන් පසට ලබාදීම.
2. පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීම / පසේ තෙතමනය රඳා පැවතීම / ගලායන ජලයේ වේගය අඩු කිරීම (4 × 2)

v. 1. පාංශු වසුන් යෙදීම
2. සුළං බාධක යොදා ගැනීම / උසස් ගොවිතැන් ක්‍රම භාවිතය (4 × 2)

TM The National e-Learning Portal for The General Education

B) i.

ක්‍රියාකාරකම	උපරිම බිම් සැකසීම	අවම බිම් සැකසීම	ශුන්‍ය බිම් සැකසීම
a) ප්‍රාථමික බිම් සැකසීම	සිදුකරයි (හොඳින් පස පෙරලයි)	සිදුකරයි	සිදු නොකරයි.
b) ද්විතියික බිම් සැකසීම	සිදුකරයි. (පස කැට පොඩි කිරීම)	පැළ සිටුවන පේළි ඔස්සේ පමණි.	බීජ සිටුවන ස්ථානයට පමණි
c) වල්නාශක භාවිතය	භාවිතය අවමය	භාවිතා කරයි	භාවිතා කරයි

(4 × 9)

ii. * විවිධ හේතු නිසා නිසි කලට බිම් සැකසීම නොකළ බිම්
* නිරතුරුව පාංශු ඛාදනයට ලක්වන බිම්
* බිම් සැකසීමට විශාල ශ්‍රමයක් හා කාලයක් ගත වන බිම් (4 × 1)

iii. a) මිනිස් බලයෙන් ක්‍රියාකරන සරල උපකරණයක්
(උදැල්ල, මුල්ලුව) (4 × 1)

b) මිනිස් බලයෙන් ක්‍රියා කරන සරල උපකරණය
(රේක්කය, උදැල්ල) (4 × 1)

iv. පස සුසංහනය වීම / තද ස්ථර ඇති වීම (4 × 1)

C) i. රෝපණ ද්‍රව්‍ය මගින් නව ශාක බිහිකර, පවතින පරිසර තත්ත්වලට ඔරොත්තු දෙන, නිරෝගී පැළ කෙටි කාලයක් තුළ දී නිපදවා, ක්ෂේත්‍රයේ සිටුවීම සඳහා සුදානම් කරන ස්ථානය තවානක් නම් වේ. (4 × 1)

ii. 1. උස් වූ තවාන්
2. ගිල් වූ පාත්ති (4 × 2)

iii. 90 m (1m) (4 × 1)

03. A) i. A - මධ්‍යෝෂ්මකාමී අවධිය
B - තාපකාමී අවධිය (4 × 2)

ii. 10^0 - 45^0C (4 × 1)

iii. a) 54.4^0C - 65.5^0C (4 × 1)

b) * වල් පැළෑටි බීජ හා රෝග කාරකයන් මිය යාම
* ශාකවලට විෂ කාබනික ද්‍රව්‍ය වියෝජනය වීම (4 × 2)

c) කොම්පෝස්ට් ගොඩ පෙරළීම (4 × 1)

iv. 1. අධික කාබනික අම්ල තිබීම
2. pH අගය අවම හෝ ඉතා වැඩි අගයක් වීම.
ලවණ සාන්ද්‍රණය අධික වීම (4 × 2)

B) i. $\frac{70-50}{50}\times 100$ (4 × 1)

$\frac{20}{50}\times 100 = 40\%$ (4 × 1)

ii. පසකට ජලය සපයා නිදහසේ ජල වහනය වූ පසු පසෙහි ඉතිරි වන ජල ප්‍රමාණයයි. (4 × 1)

iii. 1. කේශාකර්ෂණ ජලය 2. ජලාකර්ෂක ජලය (4 × 2)

iv. pF - 2.5 (4 × 1)

v. (4 × 1)



The National e-learning Portal for The General Education

C) i. අදියර — ස්ථානය
   a) ආලෝක ප්‍රතික්‍රියාව — තයිලකොයිඩ පටලය
   b) අඳුරු ප්‍රතික්‍රියාව — පංජරය (4 × 4)
ii. රතු / නිල් වර්ණ (4 × 1)
iii. බාහිර සාධක - උෂ්ණත්වය, ඔක්සිජන් සාන්ද්‍රණය
   අභ්‍යන්තර සාධක - එන්සයිම, සෛලීය සංයෝග (4 × 4)

04. A) i. කේන්ද්‍රාපසාරී පොම්පය (4 × 1)
ii. A - ඉම්පෙලරය
   B - ඉම්පෙලර ඇස
   C - ජල පොම්පයේ දේහය (4 × 3)
iii. කේන්ද්‍රාපසාරී බලය (4 × 1)
iv. 1. ස්වපූර්ණ නොවන පොම්පවල වායු බුබුළු ඉවත් කිරීමට සිදු වේ.
   2. ඉහළ උසකට ජලය පොම්ප කිරීමේ දී කාර්යක්ෂම නොවේ. (6m සීමාවේ) (4 × 2)

B) i. 1. අත්‍යවශ්‍ය මූලද්‍රව්‍ය රහිතව ශාකයකට සාමාන්‍ය ලෙස වැඩී එහි ජීවන චක්‍රය සම්පූර්ණ කළ නොහැක.
   2. අත්‍යවශ්‍ය මූලද්‍රව්‍යයකින් කෙරෙන කාර්යය වෙනත් මූලද්‍රව්‍යයකින් ඉටු කළ නොහැකි වීම.
   3. ශාකයේ පරිවෘත්තීය ක්‍රියාවලියට ඍජුවම සම්බන්ධ විය යුතුය. (4 × 2)
ii. පරිණත ශාක කොටස්වල (4 × 1)
iii.

පොහොර වර්ගය	වර්ණය	භෞතික ස්වභාවය	ජලයේ ද්‍රාව්‍යතාවය
යූරියා	සුදු	මුතුකැට වැනි (ගෝලාකාර)	හොඳින් ද්‍රාව්‍ය වේ.
සාන්ද්‍ර සුපර් පොස්පේට්	අළු	ගෝලාකාර කැට	අද්‍රාව්‍ය
මියුරියේට් ඔෆ් පොටෑෂ්	රතු දුඹුරු	කුඩා ස්ඵටික	ද්‍රාව්‍යය

(4 × 9)

iv. රොක් පොස්පේට් දීර්ඝ කාලයක් තුළ සෙමින් P_2O_5 නිදහස් කිරීම (4 × 1)

C) i. 1. මාසික වර්ෂාපතනය / ප්‍රධාන භූමි පරිහරණය
   2. උච්චත්වය / ප්‍රධාන පස් කාණ්ඩය (4 × 2)
ii. මෝසම් ක්‍රියාවලිය
   අන්තර් මෝසම් ක්‍රියාවලිය
   කාලගුණ පද්ධති (4 × 3)

<u>B</u> කොටස

(01) i. ප්‍රධාන මාතෘකා හතරක් යටතේ විස්තර කළ යුතුය.
1. දේශීය තාක්ෂණය රාජ්‍ය අනුග්‍රහය ඇතිව ඉදි කළ පළමු වැව - අභය වැව
   මහසෙන් රජු - මින්නේරි වැව
   ධාතුසේන රජු - කලා වැව
   වැනි සුදුසු උදාහරණ 2 ක් ඇසුරින් පැහැදිලි කිරීම
   වැවක සුවිශේෂී වාරි තාක්ෂණය පැහැදිලි කිරීම (රූප සටහන)
2. රාජ්‍ය අනුග්‍රහය
   රජ පවුලේ සාමාජිකයන් ගොවිතැන් කටයුතුවලට සහභාගී වීම.
   රාජ්‍ය පාලනය යටතේ වැව් ඉදි කරවා නඩත්තු කිරීම.
   ජලය බෙදා හැරීම පරීක්ෂා කිරීමට නිලධාරී මණ්ඩලයක් පත් කිරීම (පියොවදාරනන)
   වැනි සුදුසු උදා: 2 ක් ඇසුරින් පැහැදිලි කිරීම

3. මනා ජල කළමනාකාරීත්වය (වාරිකර්මාන්තය)
   වාරි ජලය සඳහා ගාස්තුවක් අය කිරීම
   ක්‍රමානුකූලව කුඹුරුවල ජලය සැපයීම
   බෙත්ම ක්‍රමයට වගා කිරීම
   වැව් ඉස්මත්තේ කුඹුක්, වැටකේ, මරඳ, මී වැනි ශාක වගාව
4. සංස්කෘතික හා ආගමික පසුබිම
   බුදුදහම හා බැඳුණු දිවි පෙවෙත තුළ කෘෂිකර්මය ධාර්මික ජීවනෝපායක් ලෙස සැළකීම.

විහාරස්ථාන ආශ්‍රිතව තිබූ අධ්‍යාපන මධ්‍යස්ථාන ආශ්‍රිතව වාරි තාක්ෂණික දැනුම ලබා දීම.
අලුත් සහල් මංගල්‍යය, දේව පූජා වැනි සංස්කෘතික අංග කෘෂිකර්මය හා බැඳී තිබීම.

ප්‍රධාන කරුණු 04 ක් සඳහන් කිරීම ල. 3 × 4
කරුණු සඳහා අදාල උදාහරණ ල. 9 × 4
වැව පිළිබඳ ආකෘතිය 02

ii. පාංශු ඛාදනය යනු යම් ස්ථානයක පිහිටි පස්, පාංශු දේහයෙන් අංශු ලෙස හෝ සමූහන ලෙස වෙන් වී, වෙනත් ස්ථානයකට පරිවහනය වී එහි තැන්පත් වීමයි. (ල. 10)

පාංශු ඛාදන ආකාර

1. විසිරි ඛාදනය
වර්ෂාවෙන් පතිත වන වැසි බිංදු පස මත ගැටීමෙන් පසු විසිරී යන ජල බිඳිති සමග පස් අංශු ඉවත් වී යාමයි.
2. ස්ථරීය ඛාදනය
බෑවුම් භූමිවල මතුපිටින් ගලායන ජලය සමග පස තුනී ස්තරයක් ලෙස සේදී යයි.
3. ඇළි ඛාදනය
මතුපිට පස් තට්ටුව ඉවත් වීමත් පස මතුපිට ජල බිංදු පතිත වීමත් නිසා ක්‍රමයෙන් පස තුළට ජලය කාන්දු වීම අවහිර වී පස මතු පිට ජලය බෑවුමේ ඉහළ සිට පහළට ගලා බසී. මෙම ගලා බසින මාර්ග ඔස්සේ ඇළි සෑදෙයි. මෙම අවස්ථාව ඇළි ඛාදනයයි.
4. ඇගිලි ඛාදනය
ඇළි ඛාදනය දිගින් දිගටම සිදු වීම නිසා කුඩා ඇළි විශාල ඇගිලි බවට පත්වේ.
5. දිය පහර ඛාදනය
ඇල දොළ ගංගා ආදියේ ඉවුරු කඩායෑම හා පතුල සේදීයාම දිය පහර ඛාදනයයි.
6. නාය යාම
පස් අංශු වෙනස් වීමක් නොමැතිව එලෙසින්ම වෙනත් ස්ථානයකට චලනය වීමයි. මෙයට හේතුව ගුරුත්වයේ බලපෑම යි.
7. පස් කඳු ගිලා බැසීම
ප්‍රථමයෙන් තිබූ මට්ටමට වඩා පහත් මට්ටමකට පස ගිලා බැසීමයි.

ක්‍රම 05ක් නම් කිරීම ල. 03
ක්‍රම 05 ක් විස්තරකිරීම
ල. 05 බැගින්
(ල. 8 × 5=40)
හැඳින්වීම = 10
50

The National e-learning Portal for The General Education

ii. බිම් සැකසීම යනු බීජ වැපිරීම හෝ පැල සිටුවීම සඳහා සුදුසු පාංශු පරිසරයක් ගොඩනැගීම සඳහා පස භෞතිකව සකස් කිරීමයි. (08)

1. පසේ සච්ඡිද්‍රතාවය
2. පාංශු ව්‍යුහය
3. ජලවහනය හා ජලය රඳා ගැනීම
4. දෘෂ්‍ය සනත්වය
5. පාංශු ගැඹුර
6. අහඹු රළු බව

ලක්ෂණ නම් කිරීම ල. 3 × 6
විස්තර කිරීම ල. 4 6

02. i. 1. උච්චත්වය
සාමාන්‍යයෙන් උච්චත්වය 1000m ක් ඉහළ යන විට උෂ්ණත්වය 6.4^0C කින් පහළ බසී.
2. භූගෝලීය පිහිටීම
භූගෝලීය පිහිටීම අනුව උෂ්. වෙනස් වේ. භූමියේ අවපාත පිහිටා ඇති විට එම ස්ථානවල උෂ්ණත්වය අඩුවේ.
උදා : හැටන් සානුව
3. වෘක්ෂලතා ගහනය
* වෘක්ෂලතා අධික විට ඒවායේ උත්ස්වේදනයේ ජල වාෂ්ප පිටවන නිසා පරිසරයේ උෂ්ණත්වය අඩුවේ.
* එමෙන් ම පරිසරයේ ඇති උෂ්ණත්වය ඉහළ යාමට හේතු වන CO_2 අවශෝෂණ ය නිසා ද වායුගෝලීය උෂ්ණත්වය අඩුවේ.
4. මිනිසාගේ ක්‍රියා

* නාගරිකරණය, වන විනාශය වැනි විවිධ ක්‍රියා නිසා ද පරිසර උෂ්ණත්වය ඉහළ යයි.

5. අභ්‍යන්තර ජලාශවල පිහිටීම
   විශාල ජලාශ මඟින් ඇති කරන ස්වාරක්ෂක ක්‍රියාව නිසා ඒ අවට උෂ්ණත්වය අඩුවේ.
6. වර්ෂාපතන ව්‍යාප්තිය
   * රත් වූ පොළොව මතට වැටෙන වැසි ජලය මඟින් තාපය අවශෝෂණය කරන නිසා වර්ෂාව වැඩි ප්‍රදේශවල උෂ්ණත්වය අඩුවේ. නම් කිරීම ල 3 x 5

විස්තර කිරීම ල. 07 බැගින් 05)

ii. බිම් සැකසීම යනු බීජ වැපිරීම හෝ පැල සිටුවීමට පස භෞතිකව සැකසීමයි. (ල. 8)

* වී බෝගය ක්ෂේත්‍රයේ සංස්ථාපනය කිරීමට සති 3 ට පෙර බිම් සැකසීම ආරම්භ කළ යුතුය. පියවර 3 කි.
  1. පළමු සී සෑම
  2. දෙවන සී සෑම
  3. මට්ටම් කිරීම හා මඩ කිරීම

1.
   * මඩ බිම් සකස් කිරීමේ දී පළමුව ක්ෂේත්‍රය අවට එළි පෙහෙළි කර ඇළවේලි ශුද්ධ කළ යුතුය.
   * මෙමඟින්, පළිබෝධ හානි අඩු වීම, ලියැද්දට හොඳින් සූර්යයාලෝකය ලැබීම, ක්ෂේත්‍රයට වල් පැළෑටි සංක්‍රමණය වීම අඩුවීම යහ මූලික අරමුණු ඉටු වේ.
   * ඉන් පහ ලියද්දට ජලය හැරවීම සිදු කරයි. එමඟින් සීසෑමට සුදුසු තත්වයට පස පත් කර ගත හැක.
   * මෙසේ ජලය බැඳ දින 2 - 3 සිට 10 - 14 කාලයක් තබා ගනී.
   * ඉන් පසු පළමු සී සෑම සිදු කරයි. මෙහි දී පස යන්තමින් වැසෙනසේ ජලය තබා ගනිමින් 20 - 25cm යන ගැඹුරට පස බුරුල් වනසේ සීසෑම සිදු කරනු ලැබේ.
   * මෙම සීසෑම නිසා පොළොව යට ඇති තද ස්තරය කැඩී යටි පස උඩුපස සමඟ මිශ්‍ර වී පස සාරවත් වේ.
   * මෙහි දී නියර කැඩුණු ස්ථාන පිළිසකර ජලය බැඳ තබනු ලැබේ.
   * කැපු පස් පිඩැල්ලක අඩක් වැසෙන සේ ජලය රඳවා ගනු ලබයි.
   * මෙමඟින් වල් පැළෑටි පාලනය කිරීමක් සිදුවේ.
2.
   * පළමු සී සෑමෙන් දින 10-14 ට පසුව දෙවන සීසෑම සිදු කළ යුතුය.
   * දෙවන සී සෑම හරස් අතට සිදු කරනු ලැබේ.
   * මේ නිසා පස තවදුරටත් සියුම් වන අතර වල් පැළෑටි පාලනය වේ.
   * දෙවන සී සෑමෙන් පසුව ගොම පොහොර, කුකුළු පොහොර, කොම්පෝස්ට් හෝ වෙනත් කාබනික පොහොර එක් කළ හැක.
3.
   * දෙවැනි සී සෑමෙන් පසු ලියදි මඩ කිරීම හා මට්ටම් කිරීම කරනු ලබයි.
   * පස පෝරු ගෑම මඟින් පස් කැට කුඩා කොටස්වලට කැඩීමත් ගොඩැලි මට්ටම් කිරීමත් කර ගත හැකිය.
   * මඩ කිරීම මඟින් වැලි, රොන්මඩ හා මැටි ලෙස වෙන වෙනම වෙන් වී පිළිවෙලින් තද ස්ථර මත තැන්පත් වී අපරාගම්‍ය ස්ථරයක් සෑදේ.

පියවර 3 ක් නම් කිරීමට

ලකුණු 03 බැගින් 3 x 3 =9

පියවර 03 විස්තර කිරීම

ල. 6 x 3 =18

එක් එක් පියවරෙන් අරමුණ පැහැදිලි කිරීම ල. 5 x 3 =15

42

iii. පාංශු ලවණතාවය අර්ථ දැක්වීම (ල 08)

1. පරිසර උෂ්ණත්වය
   උෂ්ණත්වය වැඩිවීම නිසා සිදුවන අධික වාෂ්පීකරණයත්, කේෂාකර්ෂනයත් හේතු කොට ගෙන පස මතුපිටට පැමිණෙන ජලය සමග ලවන ද මතුපිටට ගමන් කරයි.
2. වර්ෂාපතනය
   ශුෂ්ක හා අර්ධ ශුෂ්ක ප්‍රදේශවලට ලැබෙන අඩු වර්ෂාපතනය නිසා පසේ ඇති ලවණ ක්ෂරණය නොවී පස මතුපිටට ගමන් කරයි.
3. ජලවහනය
   ජලවහනය දුර්වල පස්වල වර්ෂා කාලයේ දී මතුපිට ඇති ලවණ ක්ෂරණය වී පාංශු පැතිකඩෙහි පහළ ස්තරවල එකතු වේ. එවිට වාෂ්පීකරණය මඟින් ඉවත් වේ.
4. මුහුදු ජලය ගොඩ ගැලීම
5. භූගත ජල මට්ටම
   වර්ෂා කාලයේ දී භූගත ජල මට්ටම ඉහළයාම පහත් ශුෂ්ක ප්‍රදේශවල සිදුවේ. මෙම ප්‍රදේශවල භූගත ජලය දියවී ඇති ලවන වියළි කාලයේ දී වාෂ්පීකරණය මඟින් පස මතුපිටට රැගෙන එයි.
6. ජල සම්පාදනය මඟින්

වගා බිම්වලට ජලය සම්පාදනය කිරීමේ දී ජලයේ දිය වී ඇති ලවණ පසේ එකතු වීම සිදුවේ.

7. සුළඟ මඟින්
8. රසායනික පොහොර භාවිතය
9. මාතෘ ද්‍රව්‍යය
   පස ජනනය වීමට බලපාන මාතෘ ද්‍රව්‍යවල අඩංගු ලවන පස ජනනය වීමේ දී පසට එකතු වෙයි.

(නම් කිරීමට ල. 2 කරුණු 07
විස්තර කිරීම. 04 කරුණු 07)

03. i. අකාබනික හා කාබනික ශාක පෝෂක ප්‍රභවයක් භාවිත කරමින් පසෙහි සාරවත් බව ස්ථිරසාර ලෙස පවත්වා ගනිමින් බෝග නිෂ්පාදනය කිරීමට, සමාජීය වශයෙන් පිළිගනු ලබන හා ආර්ථිකව ඵලදායී හා සලකා බලනු ලබන පාරිසරික තත්ත්වයන්ට ගැළපෙන ශාක පෝෂක ක්‍රම ඒකාබද්ධ ශාක පෝෂක පද්ධතිය නම් වේ. (ල. 8)

1. රසායනික පොහොර යොදන ප්‍රමාණය අඩු බැවින් රසායනික පොහොර සඳහා යන වියදම අඩුය.
2. රසායනික පොහොර හා කාබනික පොහොර මිශ්‍රව යොදන නිසා පසේ CEC අගය ඉහළ ගොස් අපතේ යාම වලකියි.
3. පසේ භෞතික, රසායනික, ජෛවීය ගුණාංග ඉහළ දැමීම කාබනික පොහොර මඟින් සිදු කරයි.
4. රසායනික පොහොර නිසා ඇති වන විෂ වීම් වළක්වයි.
5. පසට මහා මූලද්‍රව්‍ය පමණක් නොව ක්‍ෂුද්‍ර මූලද්‍රව්‍යය ද ලැබේ.
6. කාබනික පොහොර පසට ස්වාරක්‍ෂක ලෙස ක්‍රියා කරන නිසා පෝෂක සුලභතාව වැඩි කරයි.
7. දීර්ඝ කාලයක් තිස්සේ ක්‍රම ක්‍රමයෙන් පෝෂක ශාකයට ලබා දෙයි.
8. පසෙහි පෝෂක ක්‍ෂරණය වළක්වයි. එම නිසා භූගත ජලය දූෂනය වීම වළක්වයි.
9. පොහොර භාවිත කාර්යක්‍ෂමතාව ඉහළ යයි.
10. ක්‍ෂුද්‍රජීවී ක්‍රියාකාරීත්වය ඉහළ යයි.

නම් කිරීමට (ල. 02 කරුණු 6)
විස්තර කිරීම ල. 05 කරුණු 06 ($7 \times 6 = 42$)

ii. බිංදු ජල සම්පාදනය

බෝග වගා ක්ෂේත්‍රයේ මූල මණ්ඩල කලාපීය පස අඛණ්ඩව ක්ෂේත්‍රධාරිතාවයේ පවත්වා ගැනීම සඳහා නල ඔස්සේ එන ජලය බිංදු ලෙස වැක්සීමට සැලැස්වීම බිංදු ජල සම්පාදනයයි. (ල. 10)

වාසි

1. පස මතුපිටින් ජලය ගලා නොයන නිසා වාෂ්පීකරණ හානි අඩුය. එම නිසා අවශ්‍ය වන ජල ප්‍රමාණය අඩුය.
2. මූල මණ්ඩල කලාපය නිතර තෙත්ව පවතින නිසා ශාකයට ජල ඌනතාවක් ඇති නොවේ.
3. ජලය සමඟ පොහොරද එක්කළ හැක.
4. මතුපිට අපධාවයක් සිදු නොවන නිසා පාංශු ඛාදනය නොවේ.
5. මතුපිට තෙත් නොවන නිසා වල්පැළ මතු වීම අඩුය.
6. බෑවුම් හා සුළං අධික ප්‍රදේශවලට ද යොදා ගත හැක.
7. කම්කරු අවශ්‍යතාව අඩුය. (ල. $4 \times 5 = 20$)

අවාසි

1. ජලයේ ඇති අපද්‍රව්‍ය විමෝචකවල සිරවීම නිසා විමෝචක අවහිර විය හැක.
2. බෝගවල මුල් ගැඹුරට වර්ධනය නොවී පස මතුපිට පැතිරී වැඩීම නිසා ශාකවල නියගයට හා සුළඟට ඔරොත්තු දීමේ හැකියාව අඩුය.
3. ඉහළ තාක්ෂණික දැනුමක් අවශ්‍ය වේ.
4. යාන්ත්‍රීකරණය හා අතුරුයත්ගැම අපහසුය.
5. වැඩි ප්‍රාග්ධනයක් අවශ්‍ය වේ. (ල. 4×5)

iii. නොරිඩෝකෝ තවානක් සකසන අයුරු

නොරිඩෝකෝ තවාන හැඳින්වීම - ලකුණු 10)

1. තවානක් පිහිටුවීම සඳහා හොඳින් ආලෝකය වැටෙන සමතලා ස්ථානයක් තෝරා ගැනීම.
2. දිග 25 cm පළල 25 cm හා උස 5 cm වූ ලෑලි 4 ක් ගෙන රූප සටහනේ ලෙස රාමුවක් සාදා ගැනීම
3. හලාගත් මතුපිට පස හා කුඩු කරගත් වියළි ගොම හෝ කොම්පෝස්ට් 1:1 අනුපාතයට මිශ්‍රකර ජලය දමා තලපයක් ලෙස අනා ගැනීම.
4. දියමලන් කෑම මර්ධනයට මෙම මිශ්‍රණයට දිලීර නාශකයක් ද අවශ්‍ය නම් යෙදිය හැකිය.
5. සකස් කරගත් මිශ්‍රනයෙන් රාමුව හොඳින් පුරවා අතින් තද කර මට්ටම් කිරීම
6. දිග 5 cm හා පළල 5cm වූ කුට්ටි කැපෙන සේ මිශ්‍රණය මත රේඛා ලකුණු කොට ලී පතුරකින් කුට්ටි වෙන් වන සේ කපා ගත යුතුය.
7. කුට්ටිය මැද 0.5 cm පමණ ගැඹුරට සිදුරු ඇති කර බීජ සිටුවා පස මිශ්‍රණයෙන් සිදුර වසා පිදුරු හෝ තෙත ගෝනියකින් වසුන් කිරීම

8. බීජ පැල එන විට ආවරණය ඉවත් කිරීම
9. ක්ෂේත්‍රයේ සිටුවීමට සුදුසු තත්වයට පත් වූ විට පස් කුට්ටිය සමඟ පැළය ගෙන ස්ථිර භූමියේ සිටුවයි.

(කරුණු 8 x ලකුණු 5 = 40)

04. i. විශ්කම්භයෙන් කුඩා (0.002 mm ට වඩා අඩු) පෘෂ්ඨීක ක්ෂේත්‍රඵලය අධික ජලය තුළ අවලම්බනය වන අංශු කලිල වශයෙන් හැඳින්වේ. (ල. 08)

* කලිල අංශුවල පෘෂ්ඨයේ සෘණ ආරෝපණයක් දරයි.
* එම නිසා ඒවාට ධන අයන (කැටායන) අධිශෝෂණය කර ගැනීමේ හා හුවමාරු කිරීමේ හැකියාව පවතියි. (ල. 4 × 2)
* කලිල ආකාර 02 කි.
  1. මැටි අංශු - අකාබනික කලිල
  2. හියුමස් අංශු - කාබනික කලිල (නම් කිරීම ල. 4 × 2)

මැටි කලිල

* සිලිකා හා ඇලුමිනා ස්තර වලින් සෑදී ඇත.
* ස්ඵටික රූපී වේ. ස්ථිර හැඩයක් පවතියි.
* ස්ථායි කලිලයකි. (ල. 4 × 2)

හියුමස් අංශු

* කාබනික ද්‍රව්‍ය පිරණය වීමෙන් ලැබෙන අතරමැදි ඵලයකි.
* ස්ථායි නොවේ, තවදුරටත් ජීර්ණය වන නිසා තාවකාලික කලිලයකි.
* අස්ඵටිකරූපී වන අතර, නිශ්චිත හැඩයක් නොමැත (ල. 4 × 2)

වැදගත්කම

* පසෙහි අයන රඳවා ගැනීමට හා අයන නිදහස් කිරීමට බලපායි.
* පසේ ආම්ලිකතාවය, භාෂ්මිකතාවය කෙරෙහි වැදගත්වේ. (ල. 5 × 2 = 10)

ii. අවශ්‍යතා සපුරාගත හැකි ප්‍රමාණයෙන් ජලය වසර පුරාම හෝ වසරේ යම් කාලයක් තුළ ලබාගත හැකි ජල මූලාශ්‍රය ජල ප්‍රභවයක් ලෙස හැඳින්වේ. (ල. 08)

1. වගාකර ඇති බෝග සඳහා ප්‍රමාණවත්ව ජලය ලබා ගැනීමේ හැකියාව
2. ලබාගන්නා ජලයේ ගුණාත්මක බව හා අපද්‍රව්‍යවලින් තොර වීම
3. ජල ප්‍රභවය පෘෂ්ඨීය ද, උප පෘෂ්ඨීය ද යන්න
4. ජල ප්‍රභවය සැකසීමට හා වගා භූමියට ජලය ගෙන ඒමට අවශ්‍ය වන පිරිවැය
5. භූ විෂමතාව
6. දැනට ඇති ජල සම්පාදන ක්‍රමය හා ගළපා ගත හැකි බව
7. වගා බිම හා ජල ප්‍රභවය අතර ඇති දුර

(කරුණු නම් කිරීම 2 × 6 = 12
විස්තර කිරීම 5 × 6 = 30

(ල. 7 × කරුණු 06)

iii. කාබනික දියර පොහොර හැඳින්වීම - 10

1. සත්ව පොහොර හා ශාක පත්‍ර භාවිතයෙන් දියර පොහොර සෑදීම
2. මාලු අපද්‍රව්‍ය භාවිතයෙන් දියර පොහොර සෑදීම

අවශ්‍ය ද්‍රව්‍ය

* 25*l*ක පමණ ධාරිතාව සහිත බැරලයක්
* පොහොර බෑගයක් හෝ රෙදි මල්ලක්
* තෙත් සත්ත්ව පොහොර (ගොම)
* අමු රනිල ශාක පත්‍ර (ග්ලිරිසීඩියා)
* කොම්පෝස්ට් පොහොර ස්වල්පයක්

ක්‍රමය :

1. පොහොර බෑගයට තෙත් ගොම පොහොර ග්ලිරිසීඩියා පත්‍ර සහ කොම්පෝස්ට පොහොර යන ද්‍රව්‍ය 3/4 ක් පමණ පිරවීම
2. බෑගයේ කට වසා 25*l*ක පමණ ධාරිතාවෙන් යුත් බැරලයට බැස්ස වීම.
3. බෑගය මත ගලක් තැබීමෙන් එය බැරලයේ පතුලේ රැඳවීම
4. බැරලය ජලයෙන් පුරවා වැසීම
5. දෛනිකව මිශ්‍රණය සහිත බෑගය සෙලවීමෙන් මිශ්‍ර කිරීම
6. සති 3 ට පසු බෑගය බැරලයෙන් ඉවතට ගැනීම
7. පොහොර ද්‍රාවණය කොටස් 1 කට ජලය කොටස් 4 - 6 ක් පමණ මිශ්‍ර කර බෝගවලට යෙදීම.
8. බැරලය තුළ ද්‍රාවනය 1/2 ක් පමණ ඉතිරි කර නැවත බෑගයට අලුතින් ද්‍රව්‍ය යොදා දියර පොහොර සාදා ගැනීම.

හැඳින්වීම - ලකුණු 5
අමුද්‍රව්‍ය නම් කිරීම = ලකුණු 5
කරුණු 8 × ලකුණු 5 = ලකුණු 40
50

The National e-Learning Portal for The General Education

05. i. කෘෂිකර්මයට අදාළ කාලගුණික තොරතුරු ලබා ගැනීම සඳහා උපකරණ පිහිටුවන ස්ථානය කෘෂි කාලගුණ ඒකකය වේ. (ල. 8)

උපකරණ ස්ථාපනය කිරීම

1. සටහන් නොවන වර්ෂාමානය
   * වර්ෂාමානයේ ඉහළ කෙළවර පොළොව මට්ටමේ සිට 30cm උසින් පිහිටන පරිදි ස්ථාපනය කළ යුතුය.
   * විශේෂයෙන් සැදූ සිමෙන්ති හෝ කොන්ක්‍රීට් වේදිකාවක් තුළ මෙය ස්ථාපනය කරයි.
2. අනිලමානය හා සුළං දිශා දර්ශකය
   * පොළොව මට්ටමේ සිට 2 m ක් උසින් සවි කරයි.
   * කුමන දිශාවකින් සුළං හැමුව ද අනිල මානය එකම දිශාවට කැරකෙන පරිදි අනිල මානයේ කෝප්ප සවි කළ යුතුය.
   * සුළං දිශා දර්ශකයේ කණුව මත ප්‍රධාන දිශා හතර නිවැරදිව ලකුණු කර තිබිය යුතුය.
3. වාෂ්පීකරණ තැටිය
   * වාෂ්පීකරණ තැටියේ විශ්කම්භය 120 cm හා ගැඹුර 25 cm විය යුතුය.
   * ගැල්වනයිස් තහඩුවලින් සාදා සුදු තීන්ත ආලේප කර තිබිය යුතුය.
   * වාෂ්පීකරණ තැටිය තුළ 18 cm උසට ජලය පුරවා තිබීම.
   * ලීවලින් තැනූ ආධාරකයක් මත 15 cm උසින් තැටිය පිහිටු විය යුතුය.
   * ආරක්ෂිත වැටෙහි සිට 1.5 m ක් ඇතුළතින් ද වර්ෂාමානයේ සිට 5 mක් ඈතින් සවිකළ යුතුය.
4. පාංශු උෂ්ණත්වමානය
   * පාංශු උෂ්ණත්වමානවල දිග බල්බය පස තුළට ඇතුළත් වන සේ පස මතුපිට සිට 5cm, 10cm, 20cm, 30 cm හා 100 cm ක ගැඹුරින් පොළොව මත සවි කරනු ලැබේ.
   * ඇවිදගෙන යාමේ දී පෑගීම වැළැක්වීමට වැටකින් ආවරණය කළ යුතුය.
5. සූර්ය දීප්තමානය
   * මෙය 1.5 m උස කොන්ක්‍රීට් කුලුනක් මත 30m x 30 m පමණ වේදිකාවක් සාදා ඒ මත තැන්පත් කරනු ලැබීම
   * නැගෙනහිර බටහිර දිශා රේඛාවට අනුකූලව ස්ථාපනය කරයි.
6. උපරිම හා අවම උෂ්ණත්වමානය හා තෙත් හා වියළි බල්බ උෂ්ණත්ව මානය

   උපකරණ දෙකම ලී පුවරුවක සවිකර ස්ටිවන්සන් ආවරණය තුල සවි කරනු ලැබේ.
7. සූර්ය විකිරණමානය

   පොළොව මට්ටමේ සිට 1.5 m උසින් ස්ථානගත කරනු ලැබේ.

උපකරණ නම් කිරීමට ලකුණු 02 බැගින් 06

විස්තර කිරීමට ලකුණු 05 බැගින් 06

ii. තිරසාර බෝග වර්ධනයක් සඳහා පසට යොදන සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් කෘතිම සම්භවයක් සහිත අකාබනික ද්‍රව්‍ය වේ. (ල. 10)

<u>වාසි</u>

1. ප්‍රධාන පෝෂක වැඩි සාන්ද්‍රණයකින් අඩංගු වීම නිසා ශාකවල ඌනතා පෙන්වන අවස්ථාවට යෙදීමට හැකිවීම.
2. පෝෂක ඉතා ඉක්මනින් නිදහස් වීම නිසා ඌනතාවයක දී හොඳින් ශාකය ප්‍රතිචාර දැක්වීම
3. බෝගයේ වර්ධන අවධි අනුව සුදුසු පොහොර යෙදිය හැකි වීම
4. සුළු ප්‍රමාණවලින් අවශ්‍ය වන නිසා ප්‍රවාහනය හා ගබඩා කිරීම පහසු වේ.
5. අවශ්‍ය අවස්ථාවල දී දියර පොහොර වශයෙන් ද යොදා ගත හැක.
6. ජලයේ දියවීමේ ගුණය ඉහළ මට්ටමක පවතින හෙයින් ජල සම්පාදනය සමඟ වුවද පොහොර යෙදිය හැක. එමඟින් ශ්‍රම අවශ්‍යතාවය අවම වේ.
7. පසේ අඩංගු පෝෂක ප්‍රමාණය නිර්ණය කිරීමෙන් පසු හිඟ පෝෂකය කුමක් ද යන්න අනුව පසේ pH අගයට සුදුසුවන ආකාරයට පෝෂක යෙදිය හැක.

(ල. 5 කරුණු 4 x 20)

අවාසි

1. පාංශු ජීවීන්ගේ ක්‍රියාකාරීත්වයට හා පසේ සමතුලිතතාවයට බාධා පැමිණි විය හැක.
2. රසායනික ද්‍රව්‍ය මඟින් පසේ ව්‍යුහය දුර්වල විය හැක.
3. සමහරක් පොහොර භාවිතයෙන් පසෙහි රසායනික ගුණාංග පිරිහීමට ලක්වීම.

   උදා: $(NH_4)_2SO_4$ දිගටම භාවිතයෙන් පස ආම්ලික
4. යොදන ප්‍රමාණය, යොදන ආකාරය, ශාකයේ සිට යෙදිය යුතු දුර පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් තිබීම
5. මිල අධික නිසා ගොවීන්ට වැඩි පිරිවැයක් දැරීමට සිදුවීම.
6. නිවර්තන කාලගුණික තත්ව යටතේ දී පවතින උෂ්ණත්වය හා වර්ෂාපතනය නිසා නයිට්‍රජන් අඩංගු පොහොරවල කාර්යක්ෂමතාවය අඩු වීම. (ල. 5 × කරුණු 4= 20)

iii. හරිතශාක විසින් ජලය, CO_2, අමුද්‍රව්‍යය ලෙස ගෙන සූර්ය ශක්තිය උපයෝගී කරගෙන කාබෝහයිඩ්‍රේට් නිපදවීමේ ක්‍රියාවලියයි. (ල. 10)

බාහිර සාධක

1. ආලෝකය



a) ආලෝකය තීව්‍රතාවය
එක්තරා සීමාවක් තෙක් ආලෝක තීව්‍රතාව වැඩිවන විට ප්‍රභාසංස්ලේෂණ සීඝ්‍රතාවය වැඩිවේ.

b) ආලෝක ගුණාත්මය
නිල් හා රතු ආලෝකය ප්‍රභාසංස්ලේෂණයට වඩාත් සුදුසු අතර කොළ පාට ආලෝකය ප්‍රභාසංස්ලේෂණය නිෂේධනය කරයි

c) අලෝක කාල සීමාව
ආලෝක කාල සීමාව වැඩිවන විට ප්‍රභාසංස්ලේෂණ වන ප්‍රමාණය වැඩිවේ.

2. කාබන්ඩයොක්සයිඩ්
අනෙකුත් සාධක සීමාකාරී නොවන විට එක්තරා සීමාවක් තෙක් අවට වායුගෝලයේ කාබන්ඩයොක්සයිඩ් සාන්ද්‍රනය වැඩිවන විට ප්‍රභාසංස්ලේෂණ සීඝ්‍රතාවය වැඩිවේ.



3. උෂ්ණත්වය
අනෙකුත් සාධක සීමාකාරී නොවන විට ප්‍රශස්ථ මට්ටමක් තෙක් (20-30^{0}C) උෂ්ණත්වය වැඩිවන විට ප්‍රභාසංස්ලේෂණ සීඝ්‍රතාවය වැඩිවේ. ඉන් පසු අඩුවේ.

4. ජලය
ජලය ප්‍රභාසංස්ලේෂණයට අත්‍යාවශ්‍ය අමුද්‍රව්‍ය ඒ නිසා එය සීමා වූ විට ප්‍රභාසංස්ලේසණය අඩුවේ.

5. නිෂේධක සහ දූෂක ඃ
O_3, SO_2 වැනි වායු හා කාර්මික අපද්‍රව්‍ය මඟින් ප්‍රභාසංස්ලේෂණ වේගය අඩුවෙයි.

නම් කිරීමට ල. 3 බැගින් 5
විස්තර කිරීම 5 බැගින් 5

06. i. පාංශු පැතිකඩක ඇති අතිරික්ත ජලය වගා ක්ෂේත්‍රයෙන් කෘතිමව බැහැර කිරීම හෝ බැහැර වීම ජලවහනය නම්වේ. (ල. 10)

1. පාංශු අවකාශ තුළ ඇති අතිරික්ත ජලය බැහැර වීම නිසා පසේ වාතනය වැඩි දියුණු වේ. ස්වායු ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරීත්වය වැඩි වී කාබනික ද්‍රව්‍ය වියෝජනය වේගවත් වේ.
2. නිර්වායු තත්ව මඟ හැරී නයිට්‍රීහරණ ක්‍රියාවලි අඩාල වී නයිට්‍රජන් හානි වීම අඩුවේ.
3. මතුපිට අපධාවය අඩු වී පාංශු ඛාදනය වැළකේ.
4. පසේ ඇති ද්‍රාව්‍ය ලවණ, මීතේන්, හයිඩ්‍රජන් සල්ෆයිඩ් වායුව, යකඩ සහ මැංගනීස් අයන වැනි ද්‍රව්‍ය විෂ සහිත මට්ටමට දක්වා එකතු වීම වැළකේ.
5. පසේ වාතනය දියුණු වීම නිසා P, K වැනි පෝෂක අවශෝෂණය හොඳින් සිදුවේ.
6. බිම් සැකසීමේ, අතුරුයත් ගැමේ හා අස්වනු නෙලීමේ කටයුතු පහසුවේ.
7. ශාකවල මුල මණ්ඩල කලාපය ගැඹුරට පැතිරීම නිසා අධික නියං තත්ව යටතේ වුව ද ඔරොත්තු දීමේ හැකියාව ඇතිවේ.
8. හොඳින් ජලවහනය සිදුවීම නිසා වැඩි බෝග සංඛ්‍යාවක් වගා කිරීම මඟින් බෝග විවිධාංගිකරණය කළ හැකිවේ.
9. මූල මණ්ඩල ගැඹුර වැඩි වන නිසා බෝගයේ සන්ධාරක බව වැඩි වන අතර පෝෂක පරිසංක්‍රමණය වැඩි වී අස්වැන්න වැඩිවේ.

කරුණු 8 ක් සඳහා ලකුණු 5 බැගින්
8 5 = 40)

ii. රාජ්‍ය ආයතන
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
අපනයන කෘෂි කර්ම දෙපාර්තමේන්තුව
කෘෂි කර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
ශ්‍රී ලංකා කෘෂිකර්ම ප්‍රතිපත්ති සභාව
ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

The National e-learning Portal for The General Education

වාරිමාර්ග දෙපාර්තමේන්තුව
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
වී අලෙවි මණ්ඩලය
තේ, පොල්, රබර් පර්යේෂණ ආයතන

කෘෂි කර්මයට අදාළ ආයතන ඕනෑම 5
ආයතන 5 ට ලකුණු 4 බැගින් (4 × 5 = 20)
එක් ආයතනයක කාර්යභාරය විස්තර කිරීමට
ඕනෑම කරුණු 6 ට ලකුණු 5 බැගින් (5 × 6 = 30)

iii. දෘෂ්‍ය ඝනත්වය යනු පසේ ස්වභාවික ව්‍යුහය එලෙසින්ම පවතින අවස්ථාවේ දී පසේ ඒකීය පරිමාවක ඝන ද්‍රව්‍යයන්ගේ ස්කන්ධයයි. (ල. 5)

අවශ්‍ය උපකරණ
* 10 cm සිලින්ඩරාකාර ගැල්වනයිස් බටයක් (දාරයක් මුවහත් විය යුතුය)
* ලී කැබැල්ලක්
* මිටියක්
* මුවහත් පිහියක්
* තරාදියක්
* උදුනක්
* වාෂ්පීකරණ තැටියක්

(උපකරණ නම් කිරීමට ල. 07)

ක්‍රමය :
1. ගැල්වනයිස් බට කැබැල්ලේ පැත්තක් මුවහත් කර ගැනීම
2. සිලින්ඩරයේ මුවහත් පැත්ත පස මතුපිට තබා ඒ මත ලී කැබැල්ලක් තබා මිටියකින් තට්ටු කරමින් පසට හානියක් නොවන සේ සිලින්ඩරය පස තුළට ගිල්වීම.
3. මුවහත් පිහියකින් සිලින්ඩරය අවට පස් ඉවත් කර සිලින්ඩරය සමග පස් සාම්පලය ඉවත් කර ගැනීම
4. සිලින්ඩරයේ උඩ යට පැති සමතලා වනතෙක් පිහියකින් සූරා සිලින්ඩරයේ පිටපැත්ත පිරිසිදු කිරීම.
5. සිලින්ඩරයේ තිබූ පස්, බර කිරා ගත් වාෂ්පීකරණය තැටියට දමා 105^0C උෂ්ණත්වයේ ඇති උඳුනක නියත බරක් ලැබෙන තුරු තබා වියළා පසෙහි ස්කන්ධය සටහන් කර ගැනීම.
6. පසෙහි පරිමාව ලෙස ගැල්වනයිස් බටයේ අභ්‍යන්තර පරිමාව ලබා ගැනීම (එහි අරය r ලෙස ද උස h ලෙස ද සලකන්න.)

පියවර 6 අනුපිළිවෙලින් තිබීම
ලකුණු 4 බැගින් 4 × 6 = 24)

පාඨාංක හා ගණනය කිරීම

දෘශ්‍ය ඝණත්වය = $\frac{\text{වියළි පසෙහි ස්කන්ධය}}{\text{පසෙහි මුළු පරිමාව}}$ (ල. 3)

පාඨාංක :

වාෂ්පීකරණය තැටියේ ස්කන්ධය = W_1 g (ල. 2)

වාෂ්පීකරණය තැටිය + වියළි පසෙහි ස්කන්ධය = W_2 g (ල. 2)

පසෙහි පරිමාව = $\text{®}r^2h$ (ල. 3)

ගණනය කිරීම

දෘශ්‍ය ඝනත්වය = $\frac{W_2 - W_1}{\text{®}r^2h} g / cm^{-3}$ (ල. 4)